00011

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩ සටහන 2021/2022

අවසාන පරීක්ෂණය - 2023

**EPA2422/EPC2422/ESC2222 - ළමා අයිතිවාසිකම්**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.07.01 වේලාව - ප.ව 01.30 - ප.ව.04.30 දක්වා

---

පළමු වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## <u>පළමු වන කොටස</u>

01. ශ්‍රී ලංකාවේ පූර්ව යටත් විජිත සමයේ දී ළමා අයිතිවාසිකම් පිළිබඳව පැවැති තත්ත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ළමයාගේ "උපරිම යහපත පිළිබඳ මූලධර්මය" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

03. දරුකමට හදාගැනීම පිළිබඳව කෙටියෙන් දක්වන්න.

04. ළමයකුගේ ජීවත්වීම හා සුභ සිද්ධිය සඳහා අවශ්‍ය වන්නා වූ මූලික කොන්දේසි තුනක් (03) ලියන්න.

05. ක්‍රීඩාව හා විවේකය සඳහා අයිතීන් අහිමි වූ ළමයින් කාණ්ඩ පහක් (05) නම් කරන්න.

06. පවුලක් විරහිත ළමයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් රජයට ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාමාර්ග පහක් (05) දක්වන්න.

07. "සහභාගිත්ව අයිතිය" යන්නෙහි අර්ථය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. පෙරපාසල් ළමයින්ගේ සුරක්ෂණ අයිතිය සුරැකීමට පෙරපාසල් ගුරුවරියට ගත හැකි වගකීම් පහක් (05) ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 05 X 08 = 40)

## දෙවන කොටස

09. i. "වර්ධනය" හා "සංවර්ධනය" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

ii. දෙමාපියන්ට තම පෙරපාසල් වියේ පුතා/දුවගේ වර්ධනය හා සංවර්ධන අයිතිය සුරැකීම වෙනුවෙන් ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 06)

iii. ඉහත ක්‍රියාමාර්ග ගැනීමේ දී දෙමාපියන් මුහුණ දෙන ගැටලු දෙකක් (02) සඳහන් කර එම ගැටලු අවම කිරීමට සුදුසු උපායමාර්ග ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

10. i. 'ළමා අයිතිවාසිකම්' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02)

ii. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය යනු කුමක් ද? (ලකුණු 08)

iii. ළමා අයිතිවාසිකම් පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම් කාණ්ඩ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. i. "ළමා අපයෝජනය" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජනයට හේතු සාධක වන කරුණු හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. ලිංගික අපයෝජනයෙන් පෙරපාසල්වියේ දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා පෙරපාසල් ගුරුවරුන්ට ගත හැකි පියවර පහක් (05) විස්තර කරන්න. (ලකුණු 10)

12. i. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව අබලතාව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාව තුළ විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා ඇති සේවාවන් දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 08)

iii. ඉහත සඳහන් කළ සේවාවන් සැපයීමේ දී ශ්‍රී ලංකා රජය මුහුණ දෙන ගැටලු තුනක් (03) උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. i. ශ්‍රී ලංකාව තුළ ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් භාවය ඉහළ නැංවීමේ දී මුද්‍රිත මාධ්‍යයේ දක්නට ලැබෙන දුර්වලතා හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04)

ii. එම එක් එක් දුර්වලතා ඇතිවීම සඳහා බලපාන හේතු පරීක්ෂා කරන්න. (ලකුණු 08)

iii. ළමා අයිතිවාසිකම් පිළිබඳ මුද්‍රිත මාධ්‍යයේ පවතින ඔබ ඉහත සඳහන් කළ දුර්වලතා මගහරවා ගැනීමට යෝජනා හතරක් (04) ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.